# ශ්‍රී ලංකාවේ බැංකු අධීක්ෂණ ක්‍රියාවලිය

බී.පී.පී.එස්.පී. චන්‍ද්‍රසිරි, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා දෙවන වසර
priyadarshani.0089@gmail.com

**සංක්ෂේපය**

ආර්ථිකයේ ස්ථායීතාව හා මනා ක්‍රියාකාරීත්වය සඳහා රටක මහ බැංකුව විසින් එරට වාණිජ බැංකු අධීක්ෂණය කරනු ලබයි. එය පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද විධි විධාන අනුව ඉටු කරනු ලැබේ. බැංකු අධීක්ෂණය සඳහා වූ නෛතික රාමුව, බැංකු පනත, මුදල් නීති පනත හා විනිමය පාලන පනත යනාදියෙහි දක්වා ඇත. වර්තමාන අර්ථික ක්‍රමය තුළ වාණිජ බැංකු අධීක්ෂණය වැදගත් අංගය කි. මෙම ලිපිය මඟින් අපේක්ෂා කරනුයේ ශ්‍රී ලංකාවේ බැංකු අධීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ සවිස්තරාත්මක සටහනක් ඉදිරිපත් කිරීම යි. ඒ අනුව, බැංකු අධීක්ෂණයේ අරමුණු, බැංකු අධීක්ෂණයේ මූලික අංග සහ ඒ යටතේ බැංකු නියාමන විධි විධාන, බැංකු පරීක්ෂණ, දුර්වල බැංකු සඳහා විසඳුම් ක්‍රියාමාර්ග යනාදිය පිළිබඳ කරුණු සවිස්තරව මෙහි අන්තර්ගත වේ. මේ සඳහා පොත්පත්, සඟරා, අන්තර්ජාල තොරතුරු වැනි ද්විතියික දත්ත මූලාශ්‍ර භාවිතා කර තිබේ.

**මුඛ්‍ය පදඃ** බැංකු අධීක්ෂණය, වාණිජ බැංකු

## හැඳින්වීම

බැංකු අධීක්ෂණය යනු ආර්ථිකයේ හා මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව සහ මනා ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම සඳහා බැංකුවල ක්‍රියාකාරීත්වයේ පාලනය හා කාර්යක්ෂමතාව සඳහා රටක මහ බැංකුවක් විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගයකි. 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ 1950 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා බැංකුව සිය ප්‍රධාන අරමුණු දෙක වන ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකීම දරමින් බැංකු වර්ග දෙකක් සඳහා බලපත්‍ර නිකුත් කරයි. ඒවා නම් බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත (ඉතිරිකිරීමේ හා සංවර්ධන) බැංකු ය. ඒ අනුව මහ බැංකුවේ ප්‍රධාන අරමුණු මෙන් ම බැංකු ක්‍රමයේ මනා ක්‍රියාකාරීත්වය ආරක්ෂා කර ගැනීම උදෙසා එම බැංකු අධීක්ෂණ ක්‍රියාවලියේ මහ බැංකුව නිරත වේ. මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර ලබා දී ඇති බැංකුවලට අදාළ අධීක්ෂණ කාර්යයන් ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසිනි. බැංකු අධීක්ෂණය සඳහා වූ බාසල් කමිටුව විසින් නිර්දේශිත ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව අධීක්ෂණ කාර්යයන් ඉටු කෙරේ. දැනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු 22 ක් සහ විශේෂිත බැංකු 09 ක් අධීක්ෂණය කරනු ලබයි. රටක මූල්‍ය අතරමැදිකරණයේ යෙදෙන ප්‍රධාන සහ ප්‍රචලිත ම ආයතනය බැංකු ආයතන යි. එහි දී ව්‍යාපාරික කටයුතුවල මෙන් ම ආර්ථිකයේ ස්ථායීතාව සඳහා බැංකු පිළිබඳ මහජනතාවගේ විශ්වාසය වැදගත් ම සාධකයකි. ඒ අනුව විවිධ අංශ ඔස්සේ බැංකු අධීක්ෂණය රටක මූල්‍ය ක්‍රමය තුළ අවශ්‍ය ම ක්‍රියාවලියකි.

**බැංකු අධීක්ෂණයේ අරමුණු**

බැංකු අධීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණු දෙකකි. එනම්, බැංකු ක්‍රමයේ ස්ථායීතාව සහ බැංකු ක්‍රමයේ මනා ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම යි. ඒ අනුව එක් එක් බැංකුවල මනා ක්‍රියාකාරීත්වය සහ ස්ථායීතාව සහ රටේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වාගැනීම සඳහා බැංකු ක්‍රමයේ ස්ථායීතාව, බැංකු ක්‍රමයේ මනා ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම බැංකු අධීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණු වේ. බැංකු අධීක්ෂණ කිරීමේ අරමුණ බැංකු ආරක්ෂාකාරීව සහ දූරදර්ශීව ව්‍යාපාරික කටයුතු කිරීමට අවශ්‍ය රාමුවක් ක්‍රියාත්මක කිරීම යි (සමරසිංහ, 2011). බැංකු ක්‍රමයේ මනා ක්‍රියාකාරීත්වය තුළින් අපේක්ෂා කරනුයේ ආර්ථිකයේ මනා ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම යි. අධීක්ෂණය සෑම බැංකුවකට ම පොදුවේ ක්‍රියාත්මක කිරීම තුළින් බැංකුවල මනා ක්‍රියාකාරීත්වය පවත්වාගැනීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව මහ බැංකුවක් රටේ මූල්‍ය අධිකාරිය වශයෙන් මෙම අරමුණු දෙක මූලික කරගෙන බැංකු ක්‍රමයේ ස්ථායීතාව සඳහා බැංකු අධීක්ෂණ කටයුතුවල දී විශේෂ පියවරයන් අනුගමනය කරනු ලබයි. සෑම බැංකුවක් ම මනා ක්‍රියාකාරීත්වය ළගා කර ගැනීමට කටයුතු නොකරන විට බැංකු ක්‍රමයේ ස්ථායීතාවට බාධා ඇති වේ. එනිසා මහ බැංකුව බැංකු අධීක්ෂණ ක්‍රියාවලියේ දී බැංකු ක්‍රමයේ ස්ථායීතාවට මුල් තැනක් දෙනු ලබයි.

**බැංකු අධීක්ෂණ ක්‍රියාවලියේ මූලික අංශ**

බැංකු අධීක්ෂණ ක්‍රියාවලියේ මූලික අංශ තුනකි. එනම්, බැංකු නියාමන විධි විධාන, බැංකු පරීක්ෂණ සහ දුර්වල බැංකු සඳහා විසඳුම් ක්‍රියාමාර්ග යන අංශයන් ය.

1. බැංකු නියාමන විධි විධාන

මෙම විධි විධාන බැංකු පනතේ සහ මුදල් නීති පනත මඟින් ද ඒවා මුදල් මණ්ඩලය මඟින් ද අර්ථකථනය කර ඇත. ශ්‍රී ලංකාව තුළ ක්‍රියත්මක වන විධි විධාන කිහිපයකි.

- අවම ද්‍රවශීල වත්කම් අනුපාතය

බැංකුවක් තබාගත යුතු ද්‍රවශීලතාව පිළිබඳ අවම මට්ටමක් නියම කිරීම මෙයින් අදහස් වේ. ශ්‍රී ලංකාවේ මෙම විධි විධානය බැංකු පනතේ 21(2) වගන්තිය යටතේ මුදල් මණ්ඩලය මඟින් පනවා තිබේ. මේ අනුව සෑම වාණිජ බැංකුවක් ම මුදල් මණ්ඩලය විසින් පනවා ඇති අවම ද්‍රවශීල වත්නම් අනුපාතය හෝ ඊට ඉහළ අනුපාතයක් පවත්වාගත යුතු ය.

මුදල් මණ්ඩලය මඟින්, කාසි හා නෝට්ටු, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ගිණුම් සහ විදේශ රටවල බැංකු ගිණුම් තුළ ඇති මුදල්, ආනයන අපනයන සහ දේශීය බිල්පත්, ලැබෙමින් පවත්නා මුදල්, අන්තර් බැංකු වෙළෙඳපොළේ ලබා දී ඇති ණය, භාණ්ඩ ලදුපත මත දී ඇති ණය, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල කරන ලද ආයෝජන යනාදිය ද්‍රවශීල වත්කම් ලෙස අර්ථකථනය කර තිබේ. බැංකුවල ආරක්ෂාව සඳහාත් තැන්පතු හිමියන්ගේ විශ්වාසය ආරක්ෂා කිරීම සඳහාත් අවශ්‍ය වන ද්‍රවශීලතා මට්ටමක් පවත්වාගෙන යාමට බැංකු ක්‍රියාකරවීම මෙහි අරමුණ වේ.

- අවම ප්‍රාග්ධන අවශ්‍යතාව

බැංකුවක් තබාගත යුතු ප්‍රාග්ධනයේ අවම මට්ටක් නියම කිරීම බැංකු නියාමන විධි විධානවල තවත් කරුණකි. ලෝකයේ බොහෝ රටවල්වල බාසල් ප්‍රාග්ධන සම්මතය අනුගමනය කරමින් මෙම අවම ප්‍රාග්ධන අවශ්‍යතාව නියම කර තිබේ. ශ්‍රී ලංකාවේ මුදල් මණ්ඩලය මඟින් බැංකු පනතේ 19(7)(A) වගන්තිය යටතේ මෙම විධි විධානය පනවා තිබේ. ඒ අනුව සෑම වාණිජ බැංකුවක් ම අවම ප්‍රාග්ධනය හෝ ඊට ඉහළ මට්ටමක් පවත්වාගත යුතු ය. මේ යටතේ බැංකුවක ප්‍රාග්ධන අරමුදල් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කරයි. එනම්, මූලික ප්‍රාග්ධනය (කොටස් මුදල්, ලාභ සංචිත හා විශේෂිත සංචිත) සහ අතිරේක ප්‍රාග්ධනය (වත්කම් ප්‍රති අගය කිරීමෙන් ලැබුණු අනුමත ප්‍රාග්ධන සංචිත, විවිධ වෙන් කිරීම් හා අනුමත ණයකර)

බැංකුවේ අවදානම මත බර තැබූ වත්කම් වටිනාකමට සාපේක්ෂව අවම මට්ටමකින් මෙම මූලික ප්‍රාග්ධනය සහ මුළු ප්‍රාග්ධනය සෑම වාණිජ බැංකුවක් ම පවත්වාගත යුතු අතර, මාස තුනකට වරක් මෙම අනුපාත ගණනය පිළිබඳ වාර්තාවක් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට යැවිය යුතු වේ.

- ණයකරුවෙකුට දිය හැකි ණය පිළිබඳ උපරිම සීමාව

බැංකුවක් මහා පරිමාණයේ ගනුදෙනුකරුවන් මත රැඳීමේ අවදානම අඩු කිරීම මෙහි අරමුණ වේ. මෙය ක්‍රම දෙකකි. එනම්, ගනුදෙනුකරුට ලබා දී ඇති ණය හා පහසුකම්වල එකතුව පසුගිය වසර අවසානයේ ප්‍රාග්ධනය මෙන් 30% නොඉක්මවිය යුතු වීම සහ 15% මට්ටම ඉක්මවා ලබා දී ඇති ණයවල එකතුව බැංකුවේ මුළු ණය, අසම්භාව්‍ය ණය සහ බැංකු පහසුකම්වල එකතුව මෙන් 50% නොඉක්මවිය යුතු වීම යන ක්‍රම දෙකයි.

- කොටස් ආයෝජනය පිළිබඳ උපරිම සීමා

සමාගම්වල කොටස් ආයෝජනය සම්බන්ධයෙන් ඇතිවන අවදානම අඩු කිරීම මෙහි අරමුණ වේ. ඒ අනුව පනවා ඇති සීමා ලෙස කොළඹ කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි සමාගම්වල හැර වෙනත් සමාගම්වල මුදල් ආයෝජනය නොකළ යුතු වීම සහ මුළු ආයෝජනය බැංකුවේ ප්‍රාග්ධනය මෙන් 10% නොඉක්මවිය යුතු අතර ම ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය මෙන් 20% නොඉක්මවිය යුතු වීම ද අවශ්‍ය වේ.

- බොල් සහ අවමාණ ණය සඳහා ප්‍රතිපාදන

ණයවලින් ඇතිවෙන පාඩු ක්‍රමාණුකූලව පියවීමට බැංකුවේ ලාභයෙන් මුදල් වෙන් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරවීම මෙම විධිවිධානය පැනවීමේ අරමුණ වේ. ඒ අනුව ආපසු ගෙවීමේ ණය පහත පරිදි වර්ග කොට එම ණය සඳහා බැංකුවේ බදු ගෙවීමට පෙර ලාභයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කළ යුතු වේ. මෙම ණය ප්‍රධාන වශයෙන් බාල ණය, අඩමාණ ණය සහ බොල් ණය වශවෙන් කොටස් තුනකි.

1. බාල ණය (sub-standard)

මෙහිදී ඇප වත්කම් වටිනාකම අඩු කර ඉතිරි අයවිය යුතු මුදල මෙන් අවම වශයෙන් 20%ක ප්‍රතිපාදනය කළ යුතු ය.

2. අඩමාණ ණය (Doubtful)

මේ සඳහා ඇප වත්කම් වටිනාකම් අඩු කොට ඉතිරි සම්පූර්ණ මුදල සඳහා ප්‍රතිපාදනය කළ යුතු ය.

3. බොල් ණය (Loss)

ඇප වත්කම් වටිනාකම අඩු කොට ඉතිරි සම්පූර්ණ මුදල සඳහා ප්‍රතිපාදනය කළ යුතු ය.

මෙම විධිවිධාන තුළින් අක්‍රීය ණය හේතු කොට ගෙන නුබුන්වත්භාවයට පත් වීමේ ඉඩකඩ සීමා වේ. ශ්‍රී ලංකාවේ සෑම බැංකුවක් ම මේ පිළිබඳ වාර්තාවක් මහ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

**බැංකුවේ අධ්‍යක්ෂකවරුන් වෙත සපයන බැංකු පහසකම් සම්බන්ධ සීමා සහ කොන්දේසි**

බැංකුවක අධ්‍යක්ෂකවරුන්ට, ඔවුන්ගේ නෑදෑයින්ට සහ අධ්‍යක්ෂවරුන්ට හිමිකම් ඇති ව්‍යාපාරයන්ට බැංකු පහසකු ම් ලබා දීමේ දී බැංකු ඇපකරු, රාජ්‍ය ඇපකරු, ජාත්‍යන්තර මූල්‍ය ආයතනයන්ගේ ඇපකර රාජ්‍ය හෝ මහ බැංකු සුරැකුම්පත්, ශ්‍රී ලංකාවේ ලබා ගෙන ඇති රක්ෂණ ඔප්පු, පූර්ණ අයිතිය ඇති ස්ථාවර වත්කම්, කොළඹ කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි සමාගම්වල කොටස්, කල්බදු මත වූ ස්ථාවර වත්කම්, කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි සමාගම්වල කොටස්, ඇප සුරැකුම්පත් පමණක් ලබා ගත යුතු ය. එමෙන් ම මෙම පාර්ශවයන්ට ලබා දිය හැකි පහසුකම්වල උපරිම සීමාව ලක්ෂ පහකි. මෙසේ ලබා දෙන බැංකු පහසුකම් අදාළ වටිනාකමෙන් 30% නො ඉක්මවිය යුතු ය.

- බැංකුවක කොටස් හිමිකම පිළිබඳ උපරිම සීමා

බැංකුවේ ඒකාධිකාරී අයිතයි ට පත් වීම වැළැක්වීම මෙහි අරමුණ වේ. මුදල් මණ්ඩල නියෝගය අනුව, මුදල් මණ්ඩලයේ හා මුදල් ඇමතිතුමාගේ අවසරය මත බැංකුවක කොටස් අයිතිය 10%කට සීමා වේ.

- ස්ථාවර වත්කම් ඇතිකර ගැනීම සම්බන්ධ උපරිම සීමාව

ස්ථාවර වත්කම් හේතුකොට ගෙන බැංකුවට සිදුවිය හැකි අවධානම අඩු කිරීම මෙහි අරමුණ වේ. මෙම විධිවිධාන අනුව, වාණිජ බැංකුවක් මිල දී ගනු ලබන හෝ අත්කරනු ලබන ස්ථාවර වත්කම්වල මුළු වටිනාකම බැංකුවේ ප්‍රාග්ධනය මෙන් 15% නො ඉක්මවිය යුතු ය.

1. බැංකුවක වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ කිරීම.
2. ලාභාලාභ ප්‍රකාශනය සහ ශේෂ පත්‍රය, මහබැංකුව නිර්දේශ කරන ලද ආකෘතියකට අනුව සැකසිය යුතු වීම
3. මූල්‍ය වර්ෂය අවසාන වී මාස 5 ක් ඇතුළත මෙම මූල්‍ය වාර්තා බැංකු අධීක්ෂණ අධ්‍යක්‍ෂ වෙත ඉදිරිපත් කළයුතු වීම.
4. මහ බැංකුව විසින් අනුමත කරන ලද බාහිර විගණනවරයෙකු ලවා මූල්‍ය වාර්තා විගණනය කළ යුතු වීම.
5. විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය වාර්තා මහජනයාගේ ප්‍රදර්ශනය කිරීම.
6. විගණනය කරන වාර්ෂික වාර්තා සහ නොකළ ත්‍රෛමාසික වාර්තා පුවත්පත්වලින් ප්‍රසිද්ධ කිරීම.

**බැංකු පරීක්ෂණ**

බැංකුවක ව්‍යාපාර කටයුතු හා සැබෑ මූල්‍ය තතත්වය පිළිබඳ සොයා බැලීම මෙහි දී සිදුවෙයි. මෙම පරීක්ෂණය සඳහා මහ බැංකුව මූලික ක්‍රම 2ක් අනුගමනය කරයි.

1. අඛණ්ඩ පරීක්ෂණ ක්‍රම

බැංකුවක වගකීම්, ආදායම, වියදම සහ ලාභ, අක්‍රීය ණය සහ ප්‍රතිපාදනය, ද්‍රවශීලී වත්කම් අනුපාතය, ප්‍රාග්ධන අනුපාතය, ඉහළ වටිනාකමක් ඇති ණය, අධ්‍යක්ෂවරුන්ට සම්බන්ධ ව්‍යාපාර සහ ඔවුන්ගේ නෑදෑයින්ට ලබා දී ඇති ණය බැංකුවක කොටස් අයිතිය ආදිය සම්බන්ධ තොරතුරු බැංකුවක් විසින් කාලින පදනමක් මත එනම්, දෛනිකව, සතිපතා, මාසිකව, ත්‍රෛමාසිකව හෝ අර්ධ වාර්ෂිකව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂක වෙත සැපයිය යුතු ය. මෙම තොරතුරු විමර්ශනය කිරීම සහ අධ්‍යනය තුළින් බැංකුවකට පවතින සහ ඉදිරියේ දී ඇති විය හැකි ගැටළු හඳුනා ගෙන ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකාරීත්වය දැනුවත් කිරීම මෙහි දී සිදු වේ.

2. ස්ථානීය පරීක්ෂණ ක්‍රම

මෙම පරීක්ෂණ මඟින් බැංකුවේ මූල්‍ය දුර්වලතාවන් සඳහා ඉතා ඉක්මනින් විසඳුම් සඳහා කළමනාකාරීත්වය යොමු කෙරේ. මෙහි දී බැංකුවේ අදාළ ගිණුම් පොත් සහ ලිපි ලේඛන පරීක්ෂා කොට ලබා ගන්නා තොරතුරු තුළින් මහ බැංකු පරීක්ෂණ නිලධාරින් කණ්ඩායම් බැංකු වෙත ගොස් මූල්‍ය ත්ත්වය පිළිබඳ සොයා බලනු ලැබේ.

**දුර්වල බැංකු සඳහා විසඳුම් ක්‍රියාමාර්ග**

මේ බැංකු පණත හා මුදල් නීති පනත මඟින් දුර්වල බැංකු සම්බන්ධයෙන් වියදම් ඉදිරිපත් කිරීම හා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමේ හැකියාව මහ බැංකුවට පවතී. ඒ අනුව,

- බැංකුවේ විවිධ ව්‍යාපාරික කටයුතු සම්බන්ධ සීමා පැනවීම හා යම් කටයුතුවලින් ඉවත් වී කටයුතු කිරීමට බැංකුවට සීමා පැනවීම (ශ්‍රී ලංකාවේ බැංකු පණතේ 45(1) වගන්තිය යටතේ බැංකු අධීක්‍ෂණ අධ්‍යක්‍ෂ විසින් නියම කරයි).

- සමහර බැංකුවල ව්‍යාපාරික කටයුතු තාවකාලිකව අත් හිටුවීම. දුර්වල බැංකුවක් සම්බන්ධ පරීක්ෂණ වාර්තාවේ නිගමන අනුව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් මෙය පණවනු ලබයි. ශ්‍රී ලංකාවේ දී වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් මුදල් නීති පණතේ 30(1) යටතේ ද, විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් 76M(1) යටතේ ද මෙම ක්‍රියාමාර්ගය ගනු ලබයි. මෙසේ අත්හිට වූ බැංකුවකට මාස 6 ක් ඉක්මයාමට පෙර යම් කොන්දේසි සහිතව නැවත තම කටයුතු ආරම්භ කිරීමට අවසර දීමට මුදල් මණ්ඩලයට හැකියාව පවතී. එමෙන් ම නැවත ව්‍යාපාර කටයුතු ආරම්භ කරන වාණිජ හා විශේෂ බැංකු සම්බන්ධ විවිධ ක්‍රියාමාර්ග ගැනීමේ බලය ද බැංකු අධීක්ෂන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවතී.
- නැවත ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට අවසර ලැබෙන වාණිජ බැංකු සම්බන්ධයෙන් විසඳුම් ක්‍රියාත්මක කිරීම හා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම

මෙලෙස ශ්‍රී ලංකාවේ බැංකු අධීක්ෂණය සඳහා විධි විධාන රාශියක් පනවා ඇති අතර, ආර්ථික ක්‍රමයේ සහ මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වාගෙනයාම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම විධි විධාන ක්‍රියාත්මක කරනු ලබයි.

**සමාලෝචනය**

මහ බැංකුව විසින් බැංකු අධීක්ෂණ ක්‍රියාවලියේ නිරත වීම තුළින් බැංකු ක්‍රමයේ සාර්ථකත්වය, මූල්‍ය ක්‍රමයේ ස්ථාවරත්වය මෙන් ම බැංකු ක්‍රමය කෙරෙහි රටේ ජනතාවගේ විශ්වාසය ආරක්ෂාවීමේ පරිසරය සැකසෙන බව දක්නට ලැබේ. වර්තමාන තරඟකාරී ආර්ථික ක්‍රමය තුළ පවතින සහ අලුතින් බිහිවන වාණිජ බැංකු අධීක්ෂණය කිරීම ඉතා ම කාලෝචිත ය. මහ බැංකුව විසින් බැංකු අධීක්ෂණ ක්‍රියාවලියේ දී අනුගමනය කරනු ලබන සමහර ක්‍රියාමාර්ගවල ප්‍රායෝගික තත්ත්වය පිළිබඳ ගැටළු පැවතිය ද, සමස්තයක් වශයෙන් බොහෝ ක්‍රියාමාර්ග බැංකුවල මනා ක්‍රියාකාරීත්වයට ඉවහල් වන බව ප්‍රායෝගික ව පැහැදිලි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

නන්දසේන කේ.ඩී. (1993), *''බැංකු මූලධර්ම හා පරිචය''*, ''සීමාසහිත දීපානි (පෞද්ගලික)''

නන්දසේන කේ.ඩී. (1987), *''දේශයී බැංකු ක්‍රමයේ විවිධ ලක්ෂණ මූලධර්ම''*, සීමාසහිත දීපානි (පෞද්ගලික)

ශ්‍රී ලංකා මහ බැංකුව (2013), *"වාර්ෂික වාර්තාව"*, ඇම්,ඩී, ගුණසේණ මුද්‍රණකරුවෝ, කොළඹ 12.

Bank supervision department, Central Bank Sri Lanka (2015), *"Guidelines on opening of New bank in sri lanka"*, www.cbsl.gov.lk/htm/sinhala/05_fss/2.html vieved 15 March 2015.